**ශීර්ෂය 110 - අධිකරණ අමාත්‍යාංශය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 110 - අධිකරණ අමාත්‍යාංශයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11 (1) වගන්තිය ප්‍රකාරව අධිකරණ අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 16 දින ප්‍රධාන ගණන්දිමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අධිකරණ අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 ජුනි 26 දින ප්‍රධාන ගණන්දිමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට අධිකරණ අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්ය සාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස්කර පවත්වාගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුව ද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

**(අ) පුනරාවර්තන වියදම්**

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ පුනරාවර්තන වියදම් ගිණුම්ගත කිරීමේ දී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | මුදල් රෙගුලාසි 66 යටතේ අංක 1102 විදේශ ගමන්වියදම් වැය විෂයයට වර්ෂය තුළ මාරුකිරීම් රු.106,497 ක් වුව ද, මූල්‍ය ප්‍රකාශයේ වැඩසටහන් අනුව වියදම් ප්‍රකාශයේ ඒසීඒ - 2(i) ආකෘතියේ එය රු.115,497 ක් ලෙස දැක්වීම හේතුවෙන් ශුද්ධ ප්‍රතිපාදනය රු.9,000 ක් වැඩියෙන් දක්වා තිබුණි. | මූල්‍ය ප්‍රකාශනයේ 1102 - විදේශ ගමන් වැය විෂයයට රු.20,497 ක ප්‍රතිපාදනය වෙනුවට රු.29,497 ක ප්‍රතිපාදනය අත්වැරදීමකින් සටහන් වී ඇති හෙයින් අදාළ වැය විෂයයෙහි ශුද්ධ ප්‍රතිපාදන හා ඉතිරි ප්‍රතිපාදන රු.9,000 ක් වැඩියෙන් සටහන් වීඇති බව දන්වා තිබුණි. | මුදල් රෙගුලාසි 66 යටතේ මාරුකිරීම් නිවැරදිව ගිණුම් ගතකළ යුතු ය. |
| (ii) | අංක 110 – 01 – 2 – 19 – 1509 දරන හානි පූරණය සඳහා වූ කාර්යාල වැය විෂයයට මුදල් රෙගුලාසි 66 යටතේ මාරු කිරීම් රු.69,871,547 ක් වුව ද, මූල්‍ය ප්‍රකාශයේ වැඩසටහන් අනුව වියදම් ප්‍රකාශයේ ඒසීඒ - 2(i) ආකෘතියේ එය රු.69,880,547 ක් ලෙස පෙන්වීම හේතුවෙන් ශුද්ධ ප්‍රතිපාදන හා ඉතිරිය රු.9,000 කින් අඩුවෙන් දක්වා තිබුණි. | මූල්‍ය ප්‍රකාශනයේ හානිපූරණය සඳහා වන කාර්යාලයේ 110-01-02-19-1509 වැය විෂයය සඳහා මූ.රෙ 66 මගින් ප්‍රතිපාදන මාරුකිරීම් හි එකතුව රු.69,880,547 කි. මෙහි ඇතුළත් රු.1,654,547 ක ප්‍රතිපාදනය මාරුකිරීම රු.1,645,547 ක් විය යුතු ය. එබැවින් අදාළ වැය විෂයයෙහි ශුද්ධ ප්‍රතිපාදන හා ඉතිරිය රු.9,000 කින් අඩුවෙන් සටහන් වී ඇති බව දන්වා තිබුණි. | මුදල් රෙගුලාසි 66 යටතේ මාරුකිරීම් නිවැරදිව ගිණුම් ගතකළ යුතු ය. |

**(ආ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් 'බී' ගිණුමේ කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ එකතුව රු.86,065,992 ක් වුව ද, දෙපාර්තමේන්තු පාලන ගිණුමේ ශේෂය රු.86,058,364 ක් විය. ඒ අනුව රු.7,628 ක් වූ වෙනස හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි. | ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් වැටුප් ලබන නිලධාරීන්ගේ ණයශේෂවල වෙනස්කම් කිහිපයක් පවතී. එබැවින් එකී ණයශේෂවල අඩංගු අඩුපාඩුද නිවැරදි කරගනිමින් කඩිනමින් කේවල ශේෂවල දෝෂයන් සකස්කර ගන්නා බව දන්වා තිබුණි. | වෙනස හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතුකළ යුතු ය. |

**(ඇ) දේපල පිරියත හා උපකරණ**

දේපල පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(i)** | 2021 දෙසැම්බර් 31 දිනට සිගාස් වැඩසටහන අනුව කාර්යාලීය ගොඩනැගිලිවල කෙරීගෙන යන වැඩ ශේෂය රු.1,019,215,858 ක් වුවද, 2022 ජනවාරි 01 දිනට මූල්‍ය නොවන වත්කම් වාර්තාවේ එය රු.1,797,891,147 ක් ලෙස රු.778,675,289 ක් වැඩියෙන් දක්වා තිබුණි. | 06/2022 චක්‍රලේඛය අනුව අධිකරණ අමාත්‍යාංශය යටතට රාජ්‍ය අමාත්‍යාංශය පවරා ගැනුනි. ඒ අනුව අධිකරණ අමාත්‍යාංශයේ වැය විෂයය වන 110 යටතට රාජ්‍ය අමාත්‍යාංශයේ වත්කම් ගැලපීම සිදුකිරිමේදී රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් රාජ්‍ය අමාත්‍යාංශයට අදාළ ඍජුව සටහන් සිදුකළ අතර එහිදී SA82 අනුව 2022 ජනවාරි -01 දිනට රු.1,797,891,147 ලෙස දක්වා ඇත. ගැලපීම් සිදුකිරීමේදී මිලදිගැනීම්වල අගයන් රු.778,675,28**8** ආරම්භක ශේෂයන්ට එකතු වී ඇති බව දන්වා තිබුණි. | ගැලපීම් සිදු කිරිමේදී වූ වැරදි නිවැරදිකර මූල්‍ය ප්‍රකාශන නිවැරදිව සකස්කළ යුතු වේ. |
| **(ii)** | සමාලෝචිත වර්ෂය තුළ කෙරීගෙන යන වැඩ වියදම් රු.778,675,289 ක් මිලදීගැනුම් ලෙස SA82 වාර්තාවේ දක්වා නොතිබුණි. | සමාලෝචිත වර්ෂය තුළ රු.778,675,289 ක මිලදීගැනීම, ආරම්භක ශේෂයක් ලෙස රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් 06/2022 චක්‍රලේඛය ප්‍රකාරව රාජ්‍ය අමාත්‍යාංශයේ වත්කම් ගැලපීමේ දී SA82 ආකෘතියේ ආරම්භක දිනට ඇතුළත් කර ඇති බව දන්වා තිබුණි. | ගැලපීම් සිදුකිරිමේදී වූ වැරදි නිවැරදි කරගැනීමට කටයුතු කළ යුතු ය. |
| **(iii)** | 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල සඳහන් ප්‍රවාහන උපකරණ ශේෂය රු.473,445,200 ක් වුවද, 2022 ජනවාරි 01 දිනට එය රු.635,701,008 ක් ලෙස ඉදිරියට ගෙන ඒම හේතුවෙන් රු.162,255,808 ක් වැඩියෙන් මූල්‍ය නොවන වත්කම් වාර්තාවේ SA82 දරන ආකෘතියේ දක්වා තිබුණි. | 2021 දෙසැම්බර් 31 දිනට ප්‍රවාහන උපකරණ ශේෂය රු.473,445,200 කි. 06/2022 චක්‍රලේඛය අනුව අධිකරණ අමාත්‍යාංශය යටතට රාජ්‍ය අමාත්‍යාංශය පවරා ගැනුනි. ඒ අනුව අධිකරණ අමාත්‍යාංශයේ වැය විෂයය වන 110 යටතට රාජ්‍ය අමාත්‍යාංශයේ වත්කම් ගැලපීම සිදු කිරිමේදී රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් රාජ්‍ය අමාත්‍යාංශයට අදාළ ඍජුව සටහන් සිදුකළ අතර එහිදී SA82 අනුව 2022 ජනවාරි 01 දිනට රු.635,701,008 ලෙස දක්වා ඇත. ඒ අනුව රු.162,255,808 වෙනස රාජ්‍ය අමාත්‍යාංශය හා පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාලය ශේෂ ගැලපීම් මගින් සිදුව ඇති වෙනස බව දන්වා තිබුණි. | වත්කම් නිවැරදිව ගිණුම්ගත කිරීමට වගබලා ගත යුතු ය. |

| | | | |
|---|---|---|---|
| (iv) | 2021 දෙසැම්බර් 31 දිනට වෙනත් යන්ත්‍ර හා උපකරණ ශේෂය රු. 88,986,311 ක් වුව ද, 2022 ජනවාරි 01 දිනට එය රු. 214,722,994 ක් ලෙස රු.125,736,683 ක් වැඩියෙන් මූල්‍ය නොවන වත්කම් වර්තාවේ **SA** 82 දරන ආකෘතියේ දක්වා තිබුණි. | 2021 දෙසැම්බර් 31 දිනට යන්ත්‍ර හා උපකරණ වැඩ ශේෂය රු.88,986,311 කි. 06/2022 චක්‍රලේඛය අනුව අධිකරණ අමාත්‍යාංශය යටතට රාජ්‍ය අමාත්‍යාංශය පවරා ගැනුනි. ඒ අනුව අධිකරණ අමාත්‍යාංශයේ වැය විෂයය වන 110 යටතට රාජ්‍ය අමාත්‍යාංශයේ වත්කම් ගැලපීම සිදු කිරිමේදී රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් රාජ්‍ය අමාත්‍යාංශයට අදාළ ඍජුව සටහන් සිදුකළ අතර එහිදී SA82 අනුව 2022 ජනවාරි - 01 දිනට රු.214,722,994 ලෙස දක්වා ඇත. ඒ අනුව රු.125,736,683 වෙනස රාජ්‍ය අමාත්‍යාංශය හා පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාලය ශේෂ ගැලපීම් මගින් සිදුව ඇති වෙනස බව දන්වා තිබුණි. | ගැලපීම් සිදු කිරිමේදී වූ වැරදි නිවැරදි කරගැනීමට කටයුතු කළ යුතු ය. |
| (v) | අධිකරණ අමාත්‍යාංශය විසින් 2007 සිට 2010 කාලය තුළ රු.374,119,204 ක වියදමකින් ඉදි කරන ලද නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව විසින් භුක්ති විදින ගොඩනැගිල්ල තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | තක්සේරු වාර්තාවක් ලබාගැනීමට අදාළ වන දේපල සම්බන්ධයෙන් හිමිකම තහවුරු කෙරෙන ලේඛන ඉදිරිපත් නොකොට එම දේපල සඳහා තක්සේරු වාර්තාවක් ලබාදිය නොහැකි බව තක්සේරු දෙපාර්තමේන්තුව දන්වා ඇත. එබැවින් අදාළ ඉඩමේ නීත්‍යානුකූල අයිතිය මෙම අමාත්‍යාංශය වෙත ලබා ගැනීමෙන් අනතුරුව එම ඉඩමේ සහ ගොඩනැගිල්ලේ තක්සේරු වටිනාකම ලබා ගැනීමටත් තක්සේරු වාර්තාව ලද විගස එම වටිනාකම් CIGAS වැඩසටහන හරහා ගිණුම්ගත කිරීමට කටයුතු කරන බවත් දන්වා තිබුණි. | ඉඩමේ නිත්‍යානුකූල අයිතිය ලබාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු ය. |

**(ඇ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **වාහන ලොග් පොත**<br>මුදල් රෙගුලාසි 1645(අ) ප්‍රකාරව ජාතික ඒකාබද්ධතා හා ප්‍රතිසන්ධාන කාර්යාලය වෙත භාර දී තිබු වාහන 04 කට අදාළව වාහන ලොග් පොත් යාවත්කාලීනව පවත්වා නොතිබුණි. | අමාත්‍යාංශයේ භාවිතා කරනු ලබන සියලු වාහන සඳහා ලොග් සටහන් පොත් යාවත්කාලීනව පවත්වා ගනු ලබන බව දන්වා තිබුණි. | පොදු 267 ආකෘතිය ප්‍රකාරව වාහන ලොග් පොත් සෑම වාහනයක් සම්බන්ධයෙන්ම පවත්වාගත යුතු ය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේඅදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 110 – 1 – 4 – 6 – 2202 වැය විෂයය යටතේ දේශීය අරමුදල් වලින් රු.50,000,000 ක් ද, විදේශ මූල්‍යකරණ ආශ්‍රිත පිරිවැය වෙනුවෙන් රු.1,000,000 ක් ද, වෙන්කර තිබුණ ද එම සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි. | යාපනය දිස්ත්‍රික්කයේ වැසි ජල ටැංකි ඉදිකිරීම් ව්‍යාපෘතියේ අවබෝධතා ගිවිසුම ශ්‍රී ලංකා රජය හා ඉන්දියානු රජය විසින් 2017 වසරේ ජනවාරි 13 වන දින අත්සන් කර ඇත. නමුත් 2022.12.31 දින වන විටත් ගිවිසුම් කාලය දීර්ඝ කිරීමට අදාළ ගිවිසුම අත්සන් තබා නොමැති වීමෙන් ව්‍යාපෘතියේ ඉදිරි කටයුතු ඇණහිට ඇත. එබැවින් ප්‍රතිපාදන ඉතිරි වී ඇති බව දන්වා තිබුණි. | අවබෝධතා ගිවිසුම් කාලය දීර්ඝ කරගැනීමෙන් පසු ප්‍රතිපාදන වෙන් කරගැනීමට කටයුතු කළ යුතු වේ. |
| (ආ) | 110 – 1 – 2 – 19 – 2201 මූලධන වැය විෂයය සඳහා ප්‍රතිපාදන අනුමත කරගෙන නොතිබුණ ද, මුදල් රෙගුලාසි 66 මගින් රු.50,000 ක ප්‍රතිපාදන මාරු කරගෙන තිබුණු අතර එම සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි. | පසුගිය වසරේ පැවැති විදුලි කප්පාදුව මත විදුලිය සීමා සහිතව පාවිච්චි කිරීම හේතුවෙන් වායු සමීකරණ යන්ත්‍ර අවම ලෙස භාවිතා කරන ලදී. නමුත් හානිපූර්ණ ආයතනය පිහිටි ගොඩනැඟිල්ලේ රාජකාරී කටයුතු කිරීමේදී පැවැති අපහසුතාවය සඳහා විදුලි පංකා 04 ක් මිලට ගැනීමට මෙම ප්‍රතිපාදන මාරුකර ගත්තද, භාණ්ඩාගාරයෙන් ප්‍රාග්ධන වියදම් සඳහා අක් මුදල් ලබානොදීම හේතුවෙන් එම ප්‍රතිපාදන ඉතිරි වී ඇති බව දන්වා තිබුණි. | ප්‍රායෝගික තත්ත්වය සලකා බලා ප්‍රතිපාදන මාරුකර ගත යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2022 අප්‍රේල් 26 දිනැති 03/2022 අංක දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 3(xvii) ඡේදය ප්‍රකාරව මුදල් රෙගුලාසි 66 මගින් මුදල් මාරුකර නොගන්නා ලෙස උපදෙස් දී තිබුණ ද, පුනරාවර්තන වැය විෂයයන් 08 ක් වෙනුවෙන් රු.28,413,992 ක් මුදල් රෙගුලාසි 66 මගින් ප්‍රතිපාදන මාරු කරගෙන තිබූ අතර වර්ෂය අවසානයේ එම මාරු කිරීම් කරන ලද වැය විෂයයේ රු.23,787,632 ක් ඉතිරි වී තිබුණි. එය ඉතිරියේ ප්‍රතිශතයක් ලෙස සියයට 8 ත් සියයට 43 ත් අතර පරාසයක් ගෙන තිබුණි. | 2022 වර්ෂයේ අයවැය ඇස්තමේන්තුව මගින් වෙන්කර දී ඇති ප්‍රතිපාදන සීමාව ඇතුළත වියදම් කළමනාකරණය කරගන්නා ලෙස අංක BD/JLE/110/05/202 දරන 2022.08.16 දිනැති ලිපියෙන් දැනුම් දී ඇත.එබැවින් කල්දැමිය නොහැකි සහ අත්‍යවශ්‍ය ගෙවීම් වෙනුවෙන් ප්‍රතිපාදන සලසා ගැනීම වෙනුවෙන් මු.රෙ 66 යටතේ ප්‍රතිපාදන මාරුකර ඇත. කෙසේ නමුත් අපේක්ෂා කළ පරිදි ගෙවීම් ඇති නොවීම නිසා මු.රෙ 66 යටතේ මාරු කරන ලද ප්‍රතිපාදන ඇතැම් අවස්ථාවලදී ඉතිරි වී ඇති බව දන්වා තිබුණි. | නිවැරදි සැලසුමකට අනුව කාර්යය ඉටුකිරීමේ හැකියාව මත මුදල් රෙගුලාසි 66 මගින් ප්‍රතිපාදන සලසාගත යුතු වේ. |
| (ඈ) | වැය විෂයයන් 20 ක් සඳහා සලසාගෙන තිබුණු එකතුව රු.524,760,000 ක් වූ සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි. | අංක 03/2022 දරන චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කිරීමට සිදුවීම නිසා රාජ්‍ය වියදම් ඉතාම අත්‍යවශ්‍ය සේවාවන් සඳහා පමණක් යොදාගැනීම හේතුවෙන් අදාළ වැය විෂයයන් හි ප්‍රතිපාදන ඉතිරිවීම සිදු වී ඇත. එබැවින් මූලධන වැය විෂයයන් වන ගොඩනැගිලි සහ ඉදිකිරීම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම්, යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ අත්පත් කරගැනීම සහ වැඩි දියුණු කිරීම (2001, 2103, 2002, 2003) වැනි වැය විෂයයන්හි ප්‍රතිපාදන එලෙසින්ම ඉතිරි වී ඇති බව දන්වා තිබුණි. | ප්‍රායෝගික තත්ත්වය සලකා බලා ඇස්තමේන්තු පිළියෙල කළ යුතු ය. |
| (ඉ) | කළුතොට ගොඩනැගිල්ලෙහි ස්ථාපිත කිරීමට සැලසුම්කර තිබූ ආපන ශාලාවට අමාත්‍යාංශ නිලධාරීන් සඳහා පුටු 24 ක් (Dining Chair) පිළිවෙලින් 2022.03.24 හා 2022.04.06 දිනවල රු.71,712 ක් හා රු.14,342 කට මිලදීගෙන තිබූ අතර මුළු වියදම වූ රු.86,054 ක් විය. මෙම මිලදී ගැනීම අමාත්‍යාංශ කාර්යාලය සඳහා වූයෙන් වැය විෂයය 110 – 1 – 1 – 2102 හර කරනු වෙනුවට ඉන් රු.50,198 ක් ජාතික ඒකාබද්ධතා ප්‍රවර්ධන | මෙහි 2022 වර්ෂයේ කාර්තු පදනම මත ගිණුම් කටයුතු සිදුකළ හෙයින් 2022 වසර පළමු කාර්තුව තුළදී අතිරේක ප්‍රතිපාදන හා මාරුකිරීම් සඳහා රාජ්‍ය අයවැය දෙපාර්තමේන්තුවෙන් අවසර දීමක් සිදුනොකළ අතර, පවතින ප්‍රතිපාදන තුළ වියදම් කළමනාකරණය කරගන්නා ලෙස රාජ්‍ය අයවැය දෙපාර්තමේන්තුව විසින් වාචික උපදෙස් ලබාදී ඇති හෙයින්ද නිවැරදි වැය විෂයයට ගිණුම්ගත නොකර 110-01-05-2102 යටතේ ගිණුම්ගත කිරීම් සිදු කරනු ලැබුවේ ආපන ශාලාවට එම භාණ්ඩ | මුදල් රෙගුලාසි 66 ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| | ව්‍යාපෘතිය යටතේ 110 – 1 – 5 - 2102 වැය විෂයයට හර කර තිබුණි. මුදල් රෙගුලාසි 66 ප්‍රකාරව එකම වැඩසටහනක ව්‍යාපෘති අතර ප්‍රතිපාදන මාරු කිරීමට භාණ්ඩාගාර ලේකම්ගේ අනුමැතිය ලබාගත යුතු වුවත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි. | අත්‍යාවශ්‍ය වන හෙයින් අමාත්‍යාංශයේ සියලුම අංශවල නිලධාරීන් සඳහා පොදුවේ සේවා සපයන බැවින් ඒ ඒ ව්‍යාපෘතිවලට අදාළ නිලධාරීන්ද එම පහසුකම් භුක්ති විඳින බැවින්ද මෙම වියදමින් කොටසක් එම වැය විෂයයට හර කිරීම සාධාරණීකරනය කර ගෙවීම් කර ඇති අතර ඒ අනුව මු.රෙ. 66 ප්‍රකාරව ප්‍රතිපාදන මාරුකිරීම් සිදුකර නැත. කෙසේ වුවද, ඉදිරියේ දී ඒවැනි අතපසුවීම් සිදු නොවීමට වග බලා ගන්නා බව දන්වා තිබුණි. | |
| (ඊ) | සංචාරක බංගලාව සඳහා කාමර උණුසුම් උපකරණ 03 ක් 2022 දෙසැම්බර් 20 දින රු. 90,000 කට මිලදීගෙන තිබූ අතර 110 – 01 – 02 – 2102 වැය විෂයයෙහි ප්‍රතිපාදන නොමැති වීමෙන් 110 – 01 – 01 – 2102 ට හර කර තිබුණි. මේ සඳහා මුදල් රෙගුලාසි 66 ප්‍රකාරව භාණ්ඩාගාර ලේකම්ගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. | වර්ෂ අවසානයේ සංචාරක බංගලාවේ අවශ්‍යතාවය මත කාමර උණුසුම් උපකරණ 03 ක් මිලදී ගැනීමට සිදු විය. එසේම ප්‍රතිපාදන සීමාව තුළ පමණක් බැරකම් සඳහා එළඹිය යුතු නිසා මාරුකිරීම් සිදු නොකළ අතර ඉහත පරිදි මෙම පහසුකමද අමාත්‍යාංශයේ සියලුම නිලධාරීන් විසින් භුක්ති විඳින බැවින්, ප්‍රතිපාදනයන් පැවැති වැය විෂයයන්ට හර කර ඇත. 2023 වර්ෂයේ දී විගණනය විසින් පෙන්වා දී ඇති පරිදි අදාළ මු.රෙ. 66 ප්‍රකාරව කටයුතු කරන බව දන්වා තිබුණි. | වැය දැරීමට පෙර ප්‍රතිපාදන මාරුකර ගැනීමට කටයුතු කළ යුතු ය. |
| (උ) | එකතුව රු. 1,956,653 ක් වූ වියදම් අදාළ වැය විෂයයන්වලට හර කරනු වෙනුවට අධිකරණ පියස ඉදිකිරීමේ ව්‍යාපෘතිය වැය විෂයය අංක 110 – 1 – 2 – 2104 (22) ට හර කර තිබුණි. ඒ අනුව ගිණුම්වල දක්වා ඇති කෙරීගෙන යන වැඩ වටිනාකම රු.1,956,652 කින් අධි ගණනයක් කර ඇති බව නිරීක්ෂණය විය. මෙම වියදම් අධිකරණ පියස ඉදිකිරීමේ ව්‍යාපෘතිය සම්බන්ධ වියදම් නොවන අතර ප්‍රාග්ධන ගත කිරීමට නොහැකි වියදම් බව තවදුරටත් අනාවරණය විය. | අධිකරණ පියස ව්‍යාපෘතියට අදාළ පරිපාලන වියදම්, අනෙකුත් මාණ්ඩලික නිලධාරින් හා රියදුරු, කළමනාකරණ සේවා නිලධාරින් හා ඇතුළත් අතිකාල දීමනා 110-01-02-1002 හා එයට අදාළ පරීක්ෂා කිරීම සඳහා යොදවන ලද වාහන සඳහා ඉන්ධන ගෙවීම් 110-01-02-1202 හා අනෙකුත් ගොනු සකස් කිරීමට අදාළ A4 හා ලිපි ද්‍රව්‍ය ගෙවීම් 110-01-02-1201 මගින් සිදුකරන ලද අතර පරිපාලන වියදම් සේ හඳුනා ගැනීමක් සිදුකළ නොහැකි විය. මෙහිදී පරිපාලන වියදම් මගින් එම වියදම් ආවරණය වන හෙයින් කාර්තු පදනම මත ප්‍රතිපාදන 2022.03.31 වන දිනෙන් අවසන් වන නිසාත් එම අතිකාල, ඉන්ධන හා ලිපි ද්‍රව්‍ය වැය විෂයයන් ඉක්මවා යාම නිසාත් පරිපාලන වියදම් දැරීම සඳහා සියයට 0.5 දක්වා උපරිමයක් යටතේ සිදු කළ හැකි | අදාළ වියදම් මෙම ව්‍යාපෘතිය වෙනුවෙන්ම දැරූ බව තහවුරු කළ යුතු ය. |

| | | |
|---|---|---|
| | නිසාත් පසුව එම වැය විෂයයන් සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන නොවූ හෙයින් අදාළ අතිකාල, ඉන්ධන හා ලිපි ද්‍රව්‍ය බිල්පත් 110-01-02-2104 (22) වැය විෂයය හර කර කාර්තු ප්‍රතිපාදන ඌනතාවය සම්පූර්ණ කරගන්නා ලදී. ඉදිරියේදී අධිකරණ පියස ව්‍යාපෘතියට අදාළ බිල්පත් ඉංජිනේරු අංශය මගින්ම පරිපාලන වියදම් සහතික කර ගෙන්වා ගෙවීම් සිදු කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | |

**2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | බැරකම් පිළිබඳ ප්‍රකාශය **(i)** සටහන **(iv)** හි දක්වා ඇති එකතුව රු.1,091,163 ක් වූ බැරකම් භාණ්ඩාගාර බැදීම් හා බැරකම් වාර්තාවට (SA92) ඇතුළත් කර නොතිබුණි | සටහන (IV) හි බැරකම් ලෙස දක්වන්නේ 2022 ගිණුම් වර්ෂය අවසන් වූ පසුව, 2023 වර්ෂයේදී 2022 වර්ෂයට අදාළව ලැබෙන බිල්පත් බැවින් එම වටිනාකම CIGAS වැඩසටහන හරහා මහ භාණ්ඩාගාරය වෙත වාර්තා කිරීමට නොහැකි වී ඇති බව දන්වා තිබුණි. | බැරකම් භාණ්ඩාගාර බැදීම් හා බැරකම් වාර්තාවට (SA92) ඇතුළත් කළ යුතු ය. |
| (ආ) | ජාතික ජල සම්පාදන හා ජල ප්‍රවාහන මණ්ඩලයට හා ලංකා විදුලි බල මණ්ඩලයට ගෙවන ලද 2022 වර්ෂයේ දෙසැම්බර් මාසය වෙනුවෙන් වූ එකතුව රු.716,484 ක බිල්පත් බැරකම් ලෙස හඳුනාගෙන නොතිබුණි. | 2022 වර්ෂයේ දෙසැම්බර් මාසයට අදාළ ජල බිල්පත හා විදුලි බිල්පත ප්‍රමාද වී ලැබීම නිසා බැරකම් ලෙස අදාළ තොරතුරු වාර්තා කිරීමට නොහැකි විය. එවැනි දෝෂ 2023 වර්ෂයේ ගිණුම් සැකසීමේදී සිදු නොවීමට වගබලා ගන්නා බව දන්වා තිබුණි. | බැරකම් හඳුනාගෙන ගිණුම්ගත කළ යුතු ය. |

**2.3 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ ගණන්දීමේ නිලධාරී විසින් සිදුකළ යුතු සහතිකවීම්**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතිකවීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස්කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ | මූල්‍ය පාලනය සඳහා ඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් ආයතනය තුළ පවතින බවත්, මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන |

| | | |
|---|---|---|
| නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදුකර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කරගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදුකර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදුකළ බවට ලිඛිතව විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචනය සිදුකරන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සහතික වීමක් කර ඇති අතර, එය මූල්‍ය ප්‍රකාශ තුළ අන්තර්ගත කොට ඇති බව දන්වා තිබුණි. | ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

## 2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | නිරීක්ෂණය වටිනාකම රු. | අනුකූල නොවීම | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (i) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | | |
| | මුදල් රෙගුලාසි 104 (1) | | 2017,2019 හා 2020 වර්ෂවල වාහන 03 කට සිදු වූ අනතුරුවලට අදාළව මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | 2017, 2019 හා 2020 වර්ෂවලට අදාළ අනතුරු සම්බන්ධයෙන් මු.රෙ.104 අනුව කටයුතු කර ඇති බව දන්වා තිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |
| | මුදල් රෙගුලාසි 365 (3) | 507,377 | අග්‍රිමයන්ට අයත් මුදල් එයට නියමිත මුදල් වර්ෂයෙන් අන්‍යය වූ මුදල් වර්ෂයක ගෙවීම් පියවීම් සඳහා යොදා නොගත යුතු බව දක්වා තිබුණත්, අධිකරණ අමාත්‍යාංශ නව ගොඩනැගිල්ලට | වරිපනම් අංක 80, අධිකරණ මාවත, කොළඹ 12 ලිපිනයේ පිහිටි අධිකරණ අමාත්‍යාංශ නව ගොඩනැගිල්ලේ බිම් මහලට අදාළව 2011 සිට 2017 දක්වා වූ හිඟ වරිපනම් මුදල ලෙස රු.507,377 ක් 110-01-02-01-1404 වැය විෂයයෙන් අධිකරණ ලේකම්ගේ අනුමැතිය මත | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු ය. . |

| | | | |
|---|---|---|---|
| | අදාළව 2011 සිට 2017 දක්වා වූ හිඟ වරිපනම් 2022 වර්ෂයේ 110-1-2-1-1404 ප්‍රතිපාදන මගින් අධිකරණ අමාත්‍යාංශය විසින් ගෙවා තිබුණි. | මු.රෙ. 115 අනුමැතිය ද සමඟින් කොළඹ මහ නගර සභාව වෙත ගෙවා ඇත. මෙම දේපළෙහි නිත්‍යානුකූල අයිතිය ලබාගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතින අතර ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ නිර්දේශය මත යථා කාලයේදී ප්‍රාදේශීය ලේකම් විසින් මෙම දේපල මෙම අමාත්‍යාංශය වෙත පවරා දෙනු ඇති බව දන්වා තිබුණි. | |
| (ii) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 2008 ජුනි 26 දිනැති අංක 13/2008 දරන චක්‍රලේඛයේ 04 ඡේදය | චක්‍රලේඛය පරිදි එක් එක් නිලධාරීන් වෙනුවෙන් අනුමත කර ඇති අතිරේක ඉන්ධන ප්‍රමාණය දක්වන ලේඛනයක් අමාත්‍යාංශය විසින් පවත්වාගෙන ගොස් නොතිබුණි. | අමාත්‍යාංශයේ එක් එක් නිලධාරීන් වෙනුවෙන් ලබාදෙන අතිරේක ඉන්ධන සඳහා අධිකරණ ලේකම්ගේ අනුමැතිය ලබාගන්නා බැවින්, ඒ සඳහා දැනට ලේඛනයක් පවත්වාගෙන නොගිය ද අතිරේක ඉන්ධන ඉල්ලුම් කරන ආකෘති පත්‍රයේ එතෙක් ලබාගත් අතිරේක ඉන්ධන ප්‍රමාණය සඳහන් කරනු ලබයි.මින් ඉදිරියට චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කිරීමට සටහන් කර ගත් බව දන්වා තිබුණි. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |

## 2.5 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| මුදල් රෙගුලාසි 371 (5) ප්‍රකාරව තත්කාර්යය අතුරු අග්‍රිම නිකුත් කිරීමෙන් පසු අදාළ කාර්යය නිම කර දින 10 ක් තුළ එම අතුරු අග්‍රිමය පියවිය යුතු වුව ද, අවස්ථා 72 ක දී ලබාදුන් රු.2,375,071 ක් සම්බන්ධයෙන් එපරිදි කටයුතු කර නොතිබුණි. | මෙහිදී තත්කාර්යය අතුරු අග්‍රිම නිකුත් කිරීමෙන් පසු අදාළ කාර්ය අවසන් කර දින 10 ක් තුළ එම අතුරු විගණනයේ අග්‍රිම පියවීම සිදුකළ යුතු වුවද, අවස්ථා 72 ක දී එලෙස කටයුතු කර නොතිබූ බව දන්වා ඇත. නමුත් එහි අවස්ථා 16 ක දී නියමිත දින ගණන් ඇතුළත අතුරු අග්‍රිම පියවා ඇත. මෙහිදී අත්තිකාරම් මුදල් කුවිතාන්සි | මුදල් රෙගුලාසි පරිදි අතුරු අග්‍රිම පියවීමට කටයුතු කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| | | මගින් නියමිත කාර්ය නිමවූ වහාම පියවා ඇති නමුත් පියවීමේ වවුචරය පමාවී ගිණුම් අංශයට ඉදිරිපත් කර ඇති බව කාරුණිකව දන්වා සිටිමි.<br>කෙසේ නමුත්, එසේ දින 10 ක කාලයක් තුළ නියමිත පරිදි අත්තිකාරම් පියවීමට නොහැකි වූ අවස්ථා ඇති අතර ඉදිරියේදී තත්කාර්යය අතුරු අග්‍රිමයන් කාර්ය නිම වූ පසු වහාම සරප් වෙත ගෙවීම හෝ බිල්පත් ඉදිරිපත් කිරීම සඳහා අදාළ මාණ්ඩලික නිලධාරීන්ට දැනුවත් කිරීම් සිදුකර ඇති අතර දින 10 ඉක්මවූ අත්තිකාරම් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමුකර එම අත්තිකාරම් කඩිනමින් පියවා ගැනීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යභාරයන් ඉටු නොකිරීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අධිකරණ පරිපාලන සේවයක් ස්ථාපිත කිරීම සඳහා අධිකරණ අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කර තිබූ අංක 2020/අමප/J/L/88 දරන අමාත්‍ය මණ්ඩල සංදේශයට නිරීක්ෂණ ඉදිරිපත් කරමින් මුදල් අමාත්‍යවරයා මෙන්ම රාජ්‍ය සේවා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යවරයා විසින් මෙම සේවය පිහිටුවීමෙන් ඇතිවන ගැටලු මෙන්ම එම සේවයෙන් ඉටු කිරීමට යන කාර්යයන් වර්තමානය වන විටත් රාජ්‍ය සේවය තුළ ස්ථාපිත බවට පවසා තිබිය දී ඒ සඳහා අධ්‍යනය කර නිර්දේශ ඉදිරිපත් කිරීමට කමිටුවක් පත්කර 2023 ජනවාරි වන විට වසර 02 ක් ගත වී ඇතත්, ඒ සඳහා වාර්තාවක් ඉදිරිපත් කර නොතිබූ අතර කමිටු රැස්වීම් සඳහා සාමාජික දීමනා ලෙස රු.539,675 ක් වැය කර තිබුණි. | අධිකරණ විෂය පථයේ කටයුතු පවත්වාගෙන යෑමේදී අධිකරණ පරිපාලන සේවයක් ස්ථාපිත කිරීමේ අවශ්‍යතාවයක් පැන නැඟුණු බැවින් ඒ සම්බන්ධයෙන් අධ්‍යනය කර නිර්දේශ ඉදිරිපත් කිරීමට කමිටුවක් පත් කර ඇති අතර එම කමිටුව රැස්වී තොරතුරු කැඳවා කරුණු අධ්‍යනය කර ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීම වෙනුවෙන් සාමාජික දීමනා ගෙවා ඇත. කමිටු වාර්තා හැකි ඉක්මනින් ලබාදෙන ලෙස අවස්ථා කිහිපයකදී කමිටුවට ඉල්ලීම් කර ඇතත්, තවමත් එම වාර්තාව කමිටුව මගින් ලබා දී නොමැති බව දන්වා තිබුණි. | කමිටු වාර්තා ඉක්මනින් ලබා ගැනීමට කටයුතු කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | අමාත්‍ය මණ්ඩල ලේකම්ගේ අංක 20/1252/330/001 – 1 හා 2020 සැප්තැම්බර් 10 දිනැති කැබිනට් තීරණ දැනුම්දීමේ ලිපියෙන් ගරු මුදල් අමාත්‍යවරයා විසින් නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් කෙටුම්පත් කිරීම සම්පූර්ණ කිරීමට නිශ්චිත කාලරාමුවක් හඳුනාගැනීම සුදුසු බවට යෝජනා කර තිබුණ ද, විගණන දිනය වූ 2022 දෙසැම්බර් 31 වන විටත් කාලරාමුවක් සහ වියදම් සඳහා ඇස්තමේන්තුවක් පිළියෙල කර නොතිබුණි. තවද, මෙම අවශ්‍යතාවය සඳහා 2020,2021 හා 2022 වාර්ෂික ඇස්තමේන්තුවලින් පිළිවෙලින් රු.මිලියන 50, රු.මිලියන 100 හා රු.මිලියන 4.7 ක් වශයෙන් එකතුව රු.මිලියන 154.7 ක් අවශ්‍යතාවය හඳුනා නොගෙන ප්‍රතිපාදන සලසාගෙන තිබීමෙන් 2020, 2021 හා 2022 වර්ෂවල පිළිවෙලින් රු.41,093,108 ක්, රු.88,063,094 ක් හා රු.3,681,742 ක් හෙවත් සියයට 78 සිට සියයට 88 ක් දක්වා ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. | 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මුද්‍රණය (Digital Artwork) කරගැනීමට වෙළඳපොල මිල ගණන් පදනම් කරගෙන කලින් වර්ෂවල ඇස්තමේන්තු කර තිබුණද, 2022 වර්ෂයේ එම වියදම ඉතා අඩුවෙන් රජයේ මුද්‍රණාලය මගින් සිදුකර ගැනීම මගින් ප්‍රතිපාදන ඉතිරි විය.<br>රැස්වීම් නොපැවැත්වීම නිසා රැස්වීම් සඳහා වෙන් කරගත් ආයතනවලට ගෙවීමට නියමිතව තිබූ කුලී මුදල්, නිලධාරීන්ට ගෙවීමට තිබූ ප්‍රවාහන, සංග්‍රහ හා සහභාගීත්ව දීමනා ගෙවීමට සිදු නොවීම නිසා ද ප්‍රතිපාදන ඉතිරි වූ බව දන්වා තිබුණි. | ප්‍රායෝගික තත්ත්වය සලකා බලා ඇස්තමේන්තු පිළියෙල කර ගැනීමට කටයුතු කළ යුතු ය. |

### 3.2 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේඅදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | වරිපනම් අංක 21, මීල්ස් වීදිය, කොළඹ 12 ස්ථානයේ පිහිටි පෞද්ගලික සමාගමකට අයත් දේපළකින් හෙක්ටයාර් 2.4281 (අක්කර 06) ඉඩම් අත්පත් කරගැනීමේ පනතේ 38 (අ) අතුරු විධානය යටතේ රජයට පවරාගෙන අධිකරණ පියස ඉදිකිරීම සඳහා 2019.04.11 දිනෙන් එම ඉඩමේ භුක්තිය අධිකරණ අමාත්‍යාංශයට භාර දී තිබුණි. මේ සඳහා පෞද්ගලික ආයතනයට වන්දි ගෙවීමට ඉඩම් අමාත්‍යාංශය වෙත ප්‍රතිපාදන ලබා දී තිබුණ ද, වන්දි ගෙවීමේ කටයුතු සිදුකර නොතිබූ අතර ඒ අනුව අදාළ | වරිපනම් අංක 21, මීල්ස් වීදිය, කොළඹ 12 ස්ථානයේ පිහිටි පෞද්ගලික ආයතනයට අයත් ඉඩමෙන් හෙක්.2.4281 ක පමණ ප්‍රමාණයක් මෙම අමාත්‍යාංශය වෙත අත්කර ගැනීමට කටයුතු කරමින් පවතින අතර මේ වන විට එම ඉඩම් කොටසේ භුක්තිය මෙම අමාත්‍යාංශය වෙත භාර ගෙන ඇත. කෙසේ නමුත් භුක්තිය භාරගත් විගස අත්කර ගැනීමේ ක්‍රියාවලිය අවසන් නොවන අතර ඉඩම් අත්කර ගැනීමේ පනතේ 9 වන වගන්තිය ප්‍රකාරව වන්දි හිමිකම් පරීක්ෂණ පැවැත්වීම ප්‍රාදේශීය ලේකම් විසින් අවසන් කර ඇත. ඒ අනුව, සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය මගින් තක්සේරුගත වන්දි මුදල ප්‍රාදේශීය ලේකම් | දේපළ අමාත්‍යාංශය වෙත පවරා ගැනීමට කටයුතු කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| | ඉඩම විධිමත්ව අධිකරණ අමාත්‍යාංශයට පවරාගෙන නොතිබුණි. | වෙත නිදහස් කළ විගස වන්දි ගෙවීම අවසන් කර අදාළ දේපළ මෙම අමාත්‍යාංශය වෙත පවරාදීමට නියමිතව ඇති බව දන්වා තිබුණි. | |
| (ආ) | අධිකරණ අමාත්‍යාංශය, නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව පිහිටි ගොඩනැගිල්ල අයත් ඉඩමේ පිඹුරු පිටපත ලබාගෙන ඉඩම පවරාගැනීමේ කටයුතු අවසන් කරගෙන නොතිබුණි. | මෙම දේපළ සම්බන්ධයෙන් හිමිකම තහවුරු කෙරෙන ලේඛන ඉදිරිපත් නොකොට තක්සේරු වාර්තාවක් ලබාදිය නොහැකි බව තක්සේරු දෙපාර්තමේන්තුව දන්වා ඇත. එබැවින් අදාළ ඉඩමේ නීත්‍යානුකූල අයිතිය මෙම අමාත්‍යාංශය වෙත ලබාගැනීමෙන් අනතුරුව එම ඉඩමේ සහ ගොඩනැගිල්ලේ තක්සේරු වටිනාකම ලබා ගැනීමටත් තක්සේරු වාර්තාව ලද විගස එම වටිනාකම් CIGAS වැඩසටහන හරහා ගිණුම්ගත කිරීමට කටයුතු කරන බවත් දන්වා තිබුණි. | දේපළ අමාත්‍යාංශය වෙත පවරාගෙන තක්සේරුකර ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු ය. |
| (ඇ) | අධිකරණ අමාත්‍යාංශය විසින් භුක්ති විඳින නුවරඑළිය සංචාරක බංගලාව පිහිටි හෙක්ටයාර් 0.2023 ක් වූ ඉඩම, රක්වාන සංචාරක බංගලාව පිහිටි රූඩ් 01 පර්චස් 10 ක් වූ ඉඩම සහ බත්තරමුල්ල ළමා මහේස්ත්‍රාත්අධිකරණය පිහිටි හෙක්ටයාර් 0.1760 ක් වූ ඉඩම් පවරාගැනීමේ කටයුතු අවසන්කර නොතිබූ අතර වටිනාකම් තක්සේරු කරගෙන ද නොතිබුණි. | මෙම ඉඩම් කොටස්වල නීත්‍යානුකූල අයිතිය (පැවරුම් සහතිකය) මෙම අමාත්‍යාංශය වෙත ලබා ගැනීමෙන් අනතුරුව එම ඉඩම් සහ ගොඩනැගිලිවල තක්සේරු වටිනාකම ලබා ගැනීමටත් තක්සේරු වාර්තා ලද විගස එම වටිනාකම් CIGAS වැඩසටහන හරහා ගිණුම්ගත කිරීමටත් කටයුතු කරන බව දන්වා තිබුණි. | ඉඩම් කඩිනමින් පවරාගෙන තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු ය. |
| (ඈ) | අවුරුදු 04 ක කාලයක් අබලන්ව පැවති ත්‍රීවීල් රථය විගණනය දිනය වන විටද අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | ත්‍රීරෝද රථය රා.මු.ච. අංක 01/2020 13.2 වගන්තියේ (අ) හා (ආ) ඡේදයේ ඇති විධිවිධානයන්ට යටත්ව අපහරණය සඳහා අපහරණ කමිටු පත්කර ඊට අදාළ කටයුතු සිදු කෙරෙමින් පවතින බව දන්වා තිබුණි. | කඩිනමින් අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | බන්ධනාගාර කළමනාකරණ හා සිරකරුවන් පුනරුත්ථාපන රාජ්‍ය අමාත්‍යාංශයේ 2021 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාවට අනුව භාණ්ඩ අයිතම 160 ක් පමණ ප්‍රයෝජනයට ගත නොහැකි භාණ්ඩ ලෙස හඳුනාගෙන තිබූ අතර, එම භාණ්ඩ අපහරණය කර ගිණුම්වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි. මෙම භාණ්ඩ අතරින් ඉලෙක්ට්‍රොනික් අපද්‍රව්‍ය ලෙස හඳුනාගත් භාණ්ඩ 21 ක්, 2021 වර්ෂයේ ඔක්තෝබර් 28 දින | මේ වනවිට බන්ධනාගාර කළමනාකරණ හා සිරකරුවන් පුනරුත්ථාපන රාජ්‍ය අමාත්‍යාංශයේ 2021 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාවට අනුව අපහරණය කරන ලද හා වෙන්දේසි කරන ලද (ස්ථාවර වත්කම් ලේඛනයේ හඳුනාගත්) භාණ්ඩ CIGAS වැඩසටහන මගින් ඉවත් කිරීම සඳහා ජර්නල් සටහන් යොදා ඇති බව දන්වා තිබුණි.<br>2021 වර්ෂයේ ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය ලෙස විනාශ කළ ස්ථාවර වත්කම් ලේඛනයෙහි හඳුනාගත් අයිතම CIGAS | CIGAS වැඩසටහනෙන් ඉවත්කර මූල්‍ය ප්‍රකාශන නිවැරදිව සකස් කළ යුතු වේ. |

| | |
|---|---|
| විනාශ කිරීම සඳහා ග්‍රීන් ලින්ක් (පෞද්ගලික) සමාගමට භාර දී තිබුණ ද එම භාණ්ඩවල වටිනාකම ද ගිණුම්වලින් ඉවත්කර නොතිබුණි. | වැඩසටහන මගින් ඉවත් කිරීම සඳහා ජර්නල් සටහන් යොදා ඇති බව දන්වා තිබුණි. |

**3.3 රජයේ නිලධාරීන් ඇප තැබීම**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2011 ජනවාරි 18 දිනැති අධිකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අංක 01/2011 ප්‍රකාරව හා මුදල් රෙගුලාසි 880 ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරීන් 2022 දෙසැම්බර් 31 දින වන විට ඇප තබා නොතිබුණි. | ඇප ලියාපදිංචි කිරීමේ නිර්දේශ ලබාගැනීම සඳහා අමාත්‍යාංශ නිලධාරීන්ගේ අයදුම්පත්‍ර හා ලේඛන නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමුකර ඇති බව දන්වා තිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරීන් හඳුනා ගෙන ඇප ලබාගත යුතු ය. |

**3.4 පාඩු හා හානි**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේඅදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුළ වාහන 08 ක් අනතුරට පත් වී තිබූ අතර ඉන් වාහන 05 ක අලාභය රු.1,673,076 ක් ලෙස තක්සේරු කර තිබුණි. වාහන 03 ක් සම්බන්ධයෙන් අලාභය තක්සේරු කර නොතිබුන අතර එම සියලුම අලාභයන් සම්බන්ධව මූල්‍ය ප්‍රකාශන ආකෘතියෙහි පාඩු හා අතහැරීම් ප්‍රකාශයේ (සටහන් **i)** හි **ii -** තවදුරටත් අයකර ගැනීම් හෝ කපා හැරීම් හෝ අත්හැරීමට ඇති පාඩු පිළිබඳ ප්‍රකාශයට ඇතුළත් කර නොතිබුණි. | මෝටර් රථ දෙකකට සිදු වූ අනතුරු සම්බන්ධයෙන් මු.රෙ. 104 අනුව පත් කරන ලද විමර්ශන කමිටුව විසින් අවසන් වාර්තාව ලබාදී ඇති අතර, හානි පාඩු ලේඛනයෙන් ඉවත් කිරීමට අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව නිවැරදිව ගිණුම්ගත කර අදාළ සටහන් යෙදීමට ඉදිරියේදී කටයුතු කරන බව දන්වා තිබුණි.<br>එක් මෝටර් රථයකට 2022.11.20 දින සිදු වූ අනතුර සම්බන්ධයෙන් රක්ෂණ සමාගම විසින් රක්ෂණ හිමිකම් ලබාදීමේ කටයුතු සිදු කරමින් පවතින බව දන්වා තිබුණි. | සියලුම අලාභයන් මූල්‍ය ප්‍රකාශන ආකෘතියෙහි පාඩු හා අතහැරීම් ප්‍රකාශයට ඇතුළත් කළ යුතු ය. |
| (ආ) | වාහන 04 කට අදාළව රු.165,670 ක අලාභ අයකරගැනීම් මූල්‍ය ප්‍රකාශයෙහි ආකෘති සටහන් (I) ට ඇතුළත් කර නොතිබුණි.<br>. | මෝටර් රථ දෙකකට අදාළව අලාභය වාහන අනතුර සිදු වූ වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශන තුළ සටහන් I හි ඇතුළත් කර ඇත. අනෙකුත් වාහන මූල්‍ය ප්‍රකාශනවල සටහන් කිරීමට මඟහැරී ඇති බව පිළිගනිමි. තවත් මෝටර් රථ දෙකකට සිදු වූ අලාභය සම්බන්ධයෙන් අධිකරණ ලේකම්ගේ අනුමැතිය ලබාගෙන නිසි පරිදි ගිණුම්ගත කර අදාළ සටහන් යෙදීමට ක්‍රියා කරන බව දන්වා තිබුණි. | අලාභ අයකර ගැනීම් මූල්‍ය ප්‍රකාශයෙහි ආකෘති සටහන් **(I)** ට ඇතුළත් කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | මූල්‍ය ප්‍රකාශන සටහන (II) පොත්වලින් කපා හැරීම් පිළිබඳ ප්‍රකාශයට වර්ෂය තුළ කපා හරින ලද රු.85,978 ක වාහන අලාභ ඇතුළත් කර නොතිබුණි. | විගණන විමසුමේ දක්වා ඇති කපා හරින ලද අලාභයන් මූල්‍ය ප්‍රකාශනයේ සටහන I පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශයෙහි ඇතුළත් කර ඇත.කෙසේ නමුත්, මෙවැනි කපා හැරීම් ඉදිරියේදී මූල්‍ය ප්‍රකාශනයේ සටහන (II) පොත්වලින් කපා හැරීම පිළිබඳ ප්‍රකාශයෙහි ඇතුළත් කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | කපා හරින ලද වාහන අලාභ මූල්‍ය ප්‍රකාශන සටහන (II) ඇතුළත් කළ යුතු ය. |

## 3.5 අනාර්ථික ගනුදෙනු

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | යුක්තිය පසිඳලීම පිළිබඳ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා අමප/20/1400/330/013 අමාත්‍ය මණ්ඩල තීරණය මගින් විශේෂ ඒකකයක් පිහිටුවා තිබූ අතර එහි එක් සුවිශේෂ කර්තව්‍යයක් වූ සිවිල් නීති ප්‍රතිසංස්කරණය වෙනුවෙන් පිහිටුවන ලද උපදේශන කමිටු සාමාජිකයින් සඳහා 2022 දක්වා රු.7,238,875 ක ගෙවීම් කර තිබුණ ද, එහි ප්‍රගති වාර්තා විධිමත් පරිදි අත්සන් කර තහවුරු කිරීමක් කර නොතිබුණි. | සිවිල් නීති ප්‍රතිසංස්කරණ කමිටුව මගින් යොමුකර ගොනුවට ඇතුළත් කර ඇති වාර්තා මාර්ගගත (E- Mail) ක්‍රමය ඔස්සේ යොමුකර ඇති බැවින් අත්සන් කර යොමු කිරීමක් සිදුකර නොමැති බව දන්වා තිබුණි. | ප්‍රගති වාර්තාවල දෘඪ පිටපත් ලබාගෙන ගොනුගත කළ යුතු ය. |
| (ආ) | අමප/20/1400/330/013 අමාත්‍ය මණ්ඩල තීරණය මගින් පිහිටුවන ලද විශේෂ ඒකකය සඳහා බහු කාර්ය සංවර්ධන කාර්ය සාධන බලකායෙන් නිලධාරීන් බඳවාගැනීමට නිර්දේශ ලබාදී තිබුණ ද, එම නිර්දේශ නොසලකා නිලධාරීන් 07 දෙනෙකු ඒ සඳහා බඳවාගෙන තිබූ අතර 2022 වර්ෂය වෙනුවෙන් එම නිලධාරීන්ට රු.895,609 ක් ගෙවා තිබූ අතර විශේෂ ඒකකය ද ක්‍රියාත්මක වී නොතිබුණි. | අමාත්‍ය මණ්ඩල සංදේශ අනුව මුදල් අමාත්‍යවරයාගේ නිරීක්ෂණයන්හි සඳහන් පරිදි බහුකාර්ය සංවර්ධන කාර්යසාධක බලකා දෙපාර්තමේන්තුවෙන් පවතින පුරප්පාඩු සඳහා අවශ්‍ය සේවකයින් ලබාදෙන මෙන් අවස්ථා කිහිපයකදී ඉල්ලීම් කර තිබුණද, ඒ සඳහා සේවකයින් නොලැබීම හේතුවෙන් අමාත්‍යාංශ ලේකම්වරයාගේ ප්‍රධානත්වයෙන් 2020.10.21 දින පැවැති විශේෂ ඒකකයේ කමිටු රැස්වීමේදී ගනු ලැබූ තීරණවලට අනුව නව සේවකයින් බඳවාගෙන ඇති බව දන්වා තිබුණි. | විධිමත් පරිදි සේවකයින් බඳවා ගත යුතු ය. |

**3.6 කළමනාකරණ දුර්වලතා**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මහල් 02 කින් යුතුව පුත්තලම නීති ආධාර හා ප්‍රජා විශෝධන ගොඩනැගිල්ල ඉදිකිරීමේ කර්මාන්තය 2010 සැප්තැම්බර් 15 දින බාහිර පාර්ශවයකට රු.5,583,770 ක කොන්ත්‍රාත්තු වටිනාකමට පිරිනමා තිබුණු අතර 2011 මාර්තු 27 දින වැඩ අවසන් කර යුතුව තිබුණත් අවස්ථා 03 කදී එහි කාලය 2022 ඔක්තෝබර් 13 දක්වා දීර්ඝ කරගෙන තිබුණි. නමුත් මෙම ව්‍යාපෘතියේ වැඩ අවසන් නොකර ඉදිකිරීම් අතරමග නතර කර තිබූ අතර මේ හේතුවෙන් ප්‍රජා විශෝධන වරදකරුවන් උපදේශයනට ලක් කිරීම හා කාර්යාල කටයුතු කිරීම සඳහා වෙනම කාර්යාලයක් ස්ථාපිත කිරීමේ අවශ්‍යතාවය ඉටු වී නොතිබුණි. තවද එම කොන්ත්‍රාත්කරුට 2010 ඔක්තෝබර් 21 දිනැතිව ගෙවා තිබුණු වැඩ ඇරඹීමේ අත්තිකාරම් මුදලින් රු.254,691 ක් ද, කාර්ය සාධන ඇපකරයෙන් අයවිය යුතු රු.339,535 ක් ද 2022 දෙසැම්බර් 31 දිනට අයකරගෙන නොතිබුණි. | මෙම අයවිය යුතු කාර්ය සාධන ඇපකර හා අත්තිකාරම් මුදල් අයකර ගැනීමට නීතිපති දෙපාර්තමේන්තුව මගින් උපදෙස් ලබාගැනීම සඳහා යොමුකොට ඇති අතර ඉදිරියේදී නීතිපති උපදෙස් අනුව කටයුතු කරනු ලබන බව දන්වා තිබුණි. | වැඩ ඇරඹීමේ අත්තිකාරම් මුදල් හා කාර්ය සාධන ඇපකරයෙන් අයවිය යුතු මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතු ය. |
| (ආ) | අධිකරණ අමාත්‍යාංශය සතු වාහන 12ක් වෙනත් ආයතනවලට තාවකාලිකව ලබා දී තිබූ අතර එම වාහන නැවත ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම අමාත්‍යාංශය මගින් තාවකාලිකව වෙනත් ආයතන වෙත ලබා දී ඇති වාහන අතුරින් ධීවර අමාත්‍යාංශය වෙත ලබා දී ඇති රථ නැවත ලබාදෙන ලෙස දන්වා ලිපි නිකුත් කර ඇත. | වාහන නැවත ලබා ගැනීමට කටයුතු කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | වැඩ තහනම් කර තිබූ නිලධාරීන් 05 දෙනෙකුගෙන් හා සේවය හැර ගිය නිලධාරීන් 03 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.795,902 ක් වූ ණයශේෂ වසර 05 කට වැඩි කාලයක සිට අය නොවී පැවතිණි. | වැඩ තහනම් කළ නිලධාරින්ගේ ණයශේෂ රු.552,517 පුද්ගලයන් දෙදෙනෙකුට ලියාපදිංචි තැපැල් මගින් හා ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී මගින් දැනුම් දී ඇත. ඒ අනුව එක් පුද්ගලයකුගෙන් ණය අයකර ගැනීම සඳහා කෙසෙල්වත්ත පොලීසියේ පැමිණිල්ලක් දමා ඇති අතර, මේ වන තෙක් කෙසෙල්වත්ත පොලීසියෙන් ප්‍රතිචාරයක් නොවීය.<br>තවත් පුද්ගලයකුට විරුද්ධව කොළඹ මහාධිකරණයෙහි නඩුවක් ක්‍රියාත්මක වේ.<br>සේවය හැරගිය නිලධාරින්ගේ ණයශේෂ රු.233,405 (238,395 -4990) මෙම නිලධාරීන්ගේ ණයශේෂ අයකර ගැනීම සඳහා අවශ්‍ය නීතිමය පියවරගැනීම සඳහා අදාළ තොරතුරු නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. | අය නොවී පවතින ණය අයකර ගැනීමට කටයුතු කළ යුතු ය. |

**4.** **මානව සම්පත් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරීන් 16 දෙනෙකු ද, තෘතික මට්ටමේ නිලධාරීන් 08 දෙනෙකු ද, ද්විතීක මට්ටමේ නිලධාරීන් 40 දෙනෙකු ද, ප්‍රාථමික මට්ටමේ නිලධාරීන් 16 දෙනෙකු ද, පුරප්පාඩුව පැවතිණි. | පුරප්පාඩු තනතුරු අතරින් අධිකරණ අමාත්‍යාංශය විසින් බඳවාගත යුතු තනතුරු සඳහා බඳවාගැනීමට අවස්ථා කිහිපයකදීම රාජ්‍ය සේවයේ බඳවාගැනීම් සමාලෝචන කමිටුව වෙත යොමුකර ඇත. ඒ අනුව අනුමැතිය ලබාදුන් සහකාර ලේකම් (නීති) තනතුරට අදාළ බඳවාගැනීම් කටයුතු මේ වනවිට සිදු කෙරෙමින් පවතී. සෙසු තනතුරු පුරප්පාඩු සම්බන්ධව එම තනතුරුවල පත්වීම් බලධාරීන් වෙත දැනුම් දීමට කටයුතු කර ඇති බව දන්වා තිබුණි. | පුරප්පාඩු තනතුරු සඳහා බඳවා ගැනීමට කටයුතු කළ යුතු ය. |
| (ආ) | භාෂා පරිවර්තක (සිංහල - ඉංග්‍රීසි) තනතුරු 02 ක් හා නිශ්චල ඡායාරූප ශිල්පී තනතුරු 01 ක් අතිරික්තව පැවතිණි. | භාෂා පරිවර්තක (සිංහල - ඉංග්‍රීසි) අතිරික්ත තනතුරු 02 සම්බන්ධයෙන් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් දැනුවත් කර ඇත. නිශ්චල ඡායාරූප ශිල්පි අතිරික්ත තනතුර කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් අංක DMS/CM/**05**-VolII හා 2023.05.16 දිනැති ලිපියෙන් අනුමත කර ඇති බව දන්වා තිබුණි. | අතිරික්ත තනතුරු සඳහා කළමනාකරණ සේවා අධ්‍යක්ෂගේ අනුමැතිය ලබාගත යුතු ය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2007 හා 2014 වර්ෂයේ සිට නිශ්චල ඡායාරූප ශිල්පීන් දෙදෙනෙකු සේවයේ යොදවා සිටිය ද**,** එම තනතුරු 02 සඳහා කළමනාකරණ සේවා අනුමැතිය ලබාගෙන නොතිබුණි. | නිශ්චල ඡායාරූප ශිල්පී තනතුරු 02 කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් අංක DMS/CM/**05-**Vol II හා 2023.05.16 දිනැති ලිපියෙන්අනුමත කර ඇති බව දන්වා තිබුණි. | අදාළ තනතුරු සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබාගත යුතු වේ. |